## කාරයිතිවු ප්‍රාදේශීය සභාව
## අම්පාර දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 06 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කාරයිතිවු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 418,624 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලද ඉකුත් වර්ෂයට අදාල උසාවි දඩ මුදල් රු. 903,325 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස පෙන්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු. 1,500,000 කට නැවත තක්සේරු කරනලද ඩිපර් වාහනයක වටිනාකම ගිණුම් ප්‍රකාශනවල රු. 3,900,000 ලෙස වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) දේශිය ආදායම් කොමසාරිස් වෙත යැවියයුතු රදවා ගැනීම් බදු රු. 271,460 ක මුදලක් අවුරුදු 05 පමණ කාලයක් කැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරින් 07 දෙදෙනෙකුගෙන් අයවියයුතු රු. 86,653 ක ණය ශේෂය අදාල ආයතනවලින් අයකර ගැනිම සඳහා 2014 ජුනි 13 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 1992 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා හිග මස්කඩ බදු කුලිය වන රු. 767,894 ක මුදල අයකර ගැනීම සඳහා 2014 ජුනි 13 දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ලී බඩු සහ සවිකිරීම | 1,135,600 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මොටර් වාහන | 43,420,245 | |
| යන්ත්‍රෝපකරණ | 2,597,721 | |
| පුස්තකාල පොත් | 1,171,105 | පුස්තකාල පොත් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |

1.3.5 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

---

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්ති සහ පළාත් පාලන, නිවාස ඉදි කිරීම් සහ ඉදි කිරිම් කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවරි 13 වන දින අංක 488/16 දරණ ගැසට් පත්‍රයේ දැන්වීමේ 31(1) වන උප වගන්ති | ප්‍රාදේශිය සභාවේ කටයුතු ලිහිල් කිරීමේ අදහසින් අංගසම්පූර්ණ තීරණ ගැනීම සඳහා සහ උපදෙස් ලබා දීම සඳහා සභාවේ මුදල්, ප්‍රතිපත්ති සැලැසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂන සේවා, පාරිසරික සහ පොදු පහසුකම් යන කරුණු සඳහා වෙන් වශයෙන් කාරක සභා පත්කල තිබුණද මුදල් හැර අනිකුත් කාරක සභා සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක වී නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>------------------------------------------ | |
| (i) පරිච්ඡේදය 1<br>වගන්තිය 5 (XII) | මුදල් සහ ගබඩා ද්‍රව්‍ය රාජකාරීම වශයෙන් භාරව සිටි නිලධාරින් දෙදෙනෙකුගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය X<br>වගන්තිය 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ලද සියළුම ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 572(2) | කල් ඉකුත්වූ තැන්පත් රු. 3,021,324 ක මුදල සම්බන්ධයෙන් සභාව විසින් 2014 ජුනි 13 දක්වා කටයුතු කර නොතිබුණි |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 3,795,378 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,154,987 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 වරිපනම් හා බදු
-------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රාදේශයතුල තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු ගණනය කර අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

-------------------

ප්‍රාදේශිය සභ බල ප්‍රදේශියෙ පුද්ගලික ආයතනයන් විසින් තමන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කරන ලද ප්‍රචාරක පුවරු 10 ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. මේ හේතුවෙන් සභාව වාර්ෂිකව රු. 42,100 ක ආදායමක් අහිමිවී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 ප්‍රමාදවූ ව්‍යාපෘති

----------------

සමාලෝචිත වර්ෂයේ නිශ්චිත විශේෂ පළාත් සංවර්ධන (PSDG) ආධාර යෝජනාක්‍රමය යටතේ මිලදී ගෙන තිබූ රු. 754,200 වටිනා ප්ලාස්ටික් අඹරන යන්ත්‍රය අදාල අරමුණ සඳහා ප්‍රයෝජනයට නොගෙන 2014 ජුනි 13 දින දක්වා ගබඩාවේ රදවාගෙන තිබුණුබව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බවට වූ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය